

# සීගිරි ගී සහ මහාචාර්ය සෙනරත් පරණවිතාන

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ
**සිරිසමන් විජේතුංග** MSC පුරාවිද්‍යා

**අ** එක්දහස් අටසිය අනූ හයේ දෙසැ. 26 දා ගාල්ලේ මැටරඹ උපත ලද තරුණයෙකු ඉංග්‍රීසි උපගුරු තනතුරට ආයුබෝවන් කියා 1923 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට බැඳුණේය. ඔහු 1936 දී ආචාර්ය උපාධිය ලැබුවේය. 1940 සිට 1956 තෙක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මුල්පුටුව සැරසූ මේ විද්වතා 1957 සිට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යාව පිළිබඳ මාහාචාර්ය පුටුව සැරසුවේය.

1964 දී එයින් ද ඉසිඹු ලද ඔහු 1972 ඔක්තෝබර් මස 4 වැනිද එනම් මීට හරියටම වසර 31 කට ඉහත දී ශාරීරික වශයෙන් අපගෙන් වෙන් වූයේ ය.

එහෙත් මේ විද්වතා ජීවතුන් අතර සිටියාටත් වඩා අද කාලයේ දී අප අතර විද්වතුන් අතර පමණක් නොව සාමාන්‍ය පොදු ජනතාව අතර ද ජීවමානව සිටී. ඔහු නම් සෙනරත් පරණවිතාන. ආචාර්ය සෙනරත් පරණවිතාන ඉන් පසුව මහාචාර්ය සෙනරත් පරණවිතාන නම් වූ අප රටේ අතීත ජන උරුමයේ අඩු තැන් අපට පමණක් නොව සකල ලෝකවාසී ජනතාවටම හෙළිකළ සමකාලීනව ආසියානු කලාපයේ විසූ මහා පුරාවිද්‍යාඥයා ය. මහා අභිලේඛනඥයාය. මහා සාහිත්‍යධරයා ය.

අප මෙහි දී විශේෂයෙන් අවධාරණය කරන්නේ පුරාවිද්‍යාඥයා හා අභිලේඛණඥයා ඉතිහාසඥයා තුළ ජීවත් වූ සාහිත්‍යධරයා පිළිබඳවය. සිංහල පාලි, සංස්කෘත දෙමළ ආදී පෙරදිග භාෂා මෙන් ම අපරදිග භාෂාවත් පිළිබඳව ද හසළ විද්වතෙකු වූ මහාචාර්ය සෙනරත් පරණවිතාන පඬිවරයා විසින් ප්‍රථම වරට ලොවට හෙළි කළ සීගිරි කුරුටු ගී පිළිබඳව මෙහි දී අපි විශේෂ අවධානය යොමු කරවමු.

## සීගිරිය

සීගිරිය මේ දිනවල දී ඉමහත් ආන්දෝලනයකට ලක්ව ඇති අපගේ පුරාවිද්‍යාත්මක වූ ද ලෝක පූජිත වූද කලා කෙතකි. පැරණි වාස්තු විද්‍යාත්මක, පුරාවිද්‍යාත්මක, භූමි නිර්මාණ (land scaping) සම්භව්‍ය චිත්‍ර කලාව, අපේ පැරණි කාව්‍ය කලාව මෙන් ම පැරණි ජනතාවගේ රසඥතාවය කාව්‍යමය හැකියාව ජල කළමනාකරණය ආදී විවිධ ක්ෂේත්‍ර පිළිබඳ පර්යේෂණ කළ හැකි පස්වැනි සියවසේ නගර නිර්මාණයක් ලෙසින් සීගිරිය හඳුන්වා දිය හැකිය.

මේ අනුව සාහිත්‍ය, චිත්‍ර ආදී කලාංග පිළිබඳ විමසා බලන විට ලොව කිසිදු ශිෂ්ටාචාරයකට සම නොවන අසම සම වූ ස්වරූපයක් මේ සීගිරි පර්වතය ආශ්‍රිතව පවතින බැව් දේශීය මෙන්ම විදේශීය ජනතාවද අද ඉතා හොඳින් දන්නා කරුණකි.

අද ජාතික දයකයක් වී ඇති මේ සීගිරිය මානව වර්ගයාගේ උරුමයක් ලෙසට ද ප්‍රකාශයට පත් වී ඇත. මේ ජාතික වස්තුව තවත් වසර දහස් ගණනක් අපගේ ජාතික අනන්‍යතාවය රැක ගැනීම පිණිස ආරක්ෂා කළයුතුව ඇත.

අපගේ දෑයට හිමි වී ඇති මේ මහා සම්පත ගෝලීයකරණයට හෝ විවෘත ආර්ථිකය යන සුළිසුළං වලට ගසා ගෙනයා නොදී රැකගත යුත්තේ ඇයි ද යන්නත් මේ අවස්ථාවේදී අප විසින් කල්පනාවට ගත යුතු මූලික කරුණක් බැව් පෙන්වා දිය යුතු ය.

පැරණි සිංහලයාගේ තෙලිතුඩින් නිමවූ ද සිතුවම් ද පත්හිඳෙන් සැරසුණු හෙළ ගී ද පසුගිය සියවස තෙක් ම වැසී පැවතුණේය. සිංහල රජකාලයට පසුව සීගිරිය යළි මැතක දී හඳුන්වා දුන්නේ මෙම ස්ථානයට දෙවරක්ම (1831 හා 1833) සැපත් වූ මේජර් ෆෝබස් මහතා ය. සීගිරියේ සීගිරි ලාලනියන්ගේ රූ සිත්තම් අපට යළි පෙන්වීමට සමත් වූයේ 1875 දී රීස් ඩේවිස් පඬිවරයා එහි සැපත්වීමෙනි.

සීගිරි කැටපත් පවුරේ ලියා තිබූ පැරණි සිංහල ගී නිර්මාණ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වර හෙන්රි චාල්ස් පර්වියස් බෙල් (H. C. P. බෙල්) මහතා 1894 වර්ෂයේදී සොයා ගත්තේය. ලංකාවේ ප්‍රථම ලාංකික පුරාවිද්‍යා කොමසාරිස්වරයා වීමේ භාග්‍යය ලද ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා ඒ සීගිරි ගී වලින් කොටසක් පමණක් පිටපත් කර 1928 වර්ෂයේදී රාජකීය ආසියාතික සමිතියේ (ලංකා ශාඛාව) සඟරාව මගින් ප්‍රකාශයට පත් කළේය. ඉන් පසුව පුරාවිද්‍යා කොමසාරිස් ධුරය හොබවමින් පරණවිතාන පඬිවරයා විශ්‍රාම ගන්නා ලද වසරේදී සීගිරි කුරුටු ගී 685 අඩංගු කොට සීගිරි ග්‍රැෆිටි (SIGIRI GRAFFITI) නමින් කොණ්ඩ දෙකකින් යුක්ත ග්‍රන්ථයක් සම්පාදනය කළේය. මේ නිසා සීගිරි ගී පිළිබඳව ලෝක ජනතාවටද යම්කිසි අවබෝධයක් ලබා ගැනීමේ අවස්ථාව එළඹී ඇත. ඊට වසර හතළිස් හතරකට පසු එනම් ක්‍රි. ව. 2000 වර්ෂයේදී සීගිරි කුරුටු ගී නමින් එහි සිංහල පරිවර්තනයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලදී. පරිවර්තනය කළේ මහාචාර්ය සුචරිත ගම්ලත් මහතා විසිනි. එහි දෙවන කොටසට අයත් ග්‍රන්ථය දැන් මුද්‍රණය වෙමින් පවතී.

සීගිරි කුරුටු ගී පිළිබඳව මහා සාරගර්භ ග්‍රන්ථයක් ලියූ පරණවිතාන මහතා තමන්ගේ ග්‍රන්ථයත් සොරකම් කරමින් නැති උගත්කම් පෙන්වන්නන්ට කදිම ආදර්ශයක් දී ඇත.

# සීගිරි කැටපත් පවුරේ ගී ලීවේ කව්රුද

ධාතුසේන රජතුමා අනුරාධපුරයේ රජකම් කළේ (ක්‍රි. ව. 459 - 477) වසර දහ අටකි. ඉන්පසුව රජකමට පත් වූයේ කාශ්‍යප කුමරුය. ඔහු සීගිරියේ රජකම් කළේ (ක්‍රි. ව. 477 - 495) වසර දහ අටකි. මේ කාල සීමාව පස් වැනි සියවස සේ සැළකේ. එසේ වුවද, සීගිරි ගී දක්නට ලැබෙන්නේ ක්‍රිස්තු වර්ෂ 8 වැනි සිය වසේ සිට ය. සීගිරි ලාලන රූප හා ජල උද්‍යාන ශිලා උද්‍යාන හා භූමි දර්ශන (Land Scaping) ආදී ඒ සියලුම නිර්මාණ කාශ්‍යප රාජ යුගයේ දී සිදු කළ බව පුරාවිද්‍යාඥයින් විසින් හඳුනා ගෙන ඇත. එහෙත් සීගිරි කැටපත් පවුරේ ක්‍රිස්තු වර්ෂ පස් වැනි සිය වසට අයත් හෙවත් කාශ්‍යප යුගයේ එකද ගීයක්වත් ලියා නැත. එහෙත් කාශ්‍යප යුගයට පෙර මෙම භූමිය බෞද්ධ ආරාමයක් ලෙසින් පැවති බව පමණක් නොව භික්ෂූන්වහන්සේලා වාසය කරන ලද ගල්ලෙන් වල ලියන ලද බ්‍රාහ්මී අක්ෂර ද හමු වී ඇත. කාශ්‍යප යුගයෙන් පසුව යළිත් මෙම ස්ථානය භික්ෂූන් වහන්සේලා වාසය කළ පුදබිමක් බවට දැනට ඇති බෝධිඝර ඇතුළු වාස්තු විද්‍යාත්මක නිර්මාණ වලින් ද පැහැදිලි වෙයි. එකල සීගිරිය පබ්බත ආරාමයක් ලෙසින් පැවතුණි.

"ක්‍රිස්තු පූර්ව තුන් වැනි සියවසේ සිට ක්‍රි. ව. දහනව වැනි සියවස දක්වා වූ දීර්ඝ කාල වකවානුව තුළින් සීගිරියේ ඓතිහාසික යුගය පිළිබඳ සාධක හමුවේ. එය ප්‍රධාන වශයෙන් අවධි අටකින් නිරූපණය කරයි. සීගිරිය පිළිබඳ කරුණු අධ්‍යයනයේ දී සීගිරි චිත්‍ර, සීගිරි කැටපත් පවුර ගල උඩ මාළිගය, සීගිරි කුරුටු ගී, සීගිරි උද්‍යානය, දෙරටු, මණ්ඩප යනාදී ප්‍රසිද්ධ පුරාවිද්‍යාත්මක අංග පිළිබඳ අප ලබා සිටින දැනුමට අමතරව මෙම කාල රාමුව විශේෂ වන්නේ ලාංකික විහාර ආරාම සම්ප්‍රදයයන් දෙකක වාස්තු විද්‍යාත්මක තොරතුරු විද්‍යමාන කරන බැවිනි. ඒවා නම් :

1. ලෙන් විහාර (චෛත්‍රිය විහාර) සහ 2. පබ්බත විහාර ආරාම වශයෙනි.

ඓතිහාසික යුගයේ ප්‍රථම අවධිය වූ ක්‍රි. පූ. 3 වැනි සිය වසේ සිට ක්‍රි. ව. 1 සියවස දක්වා වූ කාලය තුළින් හෙළිවන්නේ ලෙන් විහාර සම්ප්‍රදයයි. සීගිරි නගර සැලැස්ම තුළ විසිරී ඇති ස්වාභාවික ගල්ලෙන් තුළින් ඊට තොරතුරු සපයනු ලබයි. බෞද්ධ භික්ෂූන් ගේ ලෙන් විහාර සංකීර්ණයක් ලෙස ජනාවාස වූ මේවායේ ඒ ඒ පුද්ගලයින් විසින් ගල්ලෙන් පූජා කළ අන්දම දැක්වේ.

බ්‍රාහ්මී අක්ෂර පාඨයන් සහිත ලෙන් අභ්‍යන්තරයට වර්ෂ ජලය ගලා ඒම වැළැක්වීම පිණිස සැකසූ කටාරම් සහ ලෙන ආවරණය කිරීම පිණිස (ගෙයක් ලෙස සකස් කිරීමට) යොදා ගත් ගඩොල් හා ගල් බිත්ති අවශේෂ තවමත් ලෙන් අසල ශේෂව පවතී. ක්‍රිස්තු වර්ෂ 1 වැනි සියවස සිට පස්වන සියවස දක්වා වූ කාලය ප්‍රාග් කාශ්‍යප යුගය වේ. මෙම අවධියේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ පුරා විද්‍යාත්මක වශයෙන් සිදු කළ පර්යේෂණ වලදී කිසිදු ද්‍රව්‍යමය සාක්ෂියක් අනාවරණය නොවීමයි. වෙනත් ආකාරයකට පවසතොත් වර්ෂ 300 ක පමණ කාලයක් බෞද්ධ ආයතනයක් ලෙස පැවති සීගිරි ප්‍රදේශය ඉන් පසුව අභාවයට යෑමේ ස්වභාවයක් මෙම අවධියේ දී පිළිබිඹු කිරීමයි. ඓතිහාසික වශයෙන් සීගිරියේ ප්‍රධාන ගොඩනැගිලි ඉදි කිරීම් සහිතව සීගිරි නාගරික සැලැස්ම නිර්මාණය වූයේ කාශ්‍යප රජතුමාගේ (ක්‍රි. ව. 477 - 495) රාජ්‍ය පාලනය තුළ දී බව පැහැදිලි වේ. ඓතිහාසික යුග බෙදීම්වලට අනුව මෙය තෙවැනි අවධිය ලෙස පෙන්නා දිය හැකිය. පබ්බත විහාර ආරාමය හා සම්බන්ධ කතා පුවත ඇතුළත් වන්නේ සිව්වැනි අවධියටයි. (සීගිරිය ආරාමික පුරා විද්‍යාව - පි. 17 - 18 - 1998 ප්‍රශාන්ත ගුණවර්ධන - කැළණි විශ්ව විද්‍යාලයේ පුරා විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යයි.)

ඉහත සඳහන් කරුණු අනුව මෙම සීගිරිය කාශ්‍යප රාජ යුගයට පෙරත් පසුවත් බෞද්ධාගමික මධ්‍යස්ථානයක් ලෙසින් පැවතුණු බැව් සනාථ වේ. විශේෂයෙන්ම බෞද්ධාගමික මධ්‍යස්ථානයක් වූ අන්දමත් එහි කාශ්‍යපට පසු රජකම් කිරීමට මුගලන් කුමරු නැවත අනුරාධපුරය තෝරා ගැනීමත් නිසා සීගිරිය සාමාන්‍ය ජනතාව ගැවසෙන ස්ථානයක් බවට පත් වූයේය. මේ නිසාම සීගිරිය නැරඹීමට පැමිණි එකල සිංහල ජනතාව සීගිරි කැටපත් පවුරෙහි ගී ලිවීම ආරම්භ කර ඇත්තේ ක්‍රිස්තු වර්ෂ අට වැනි සියවසේ සිට ය. වසර තුන් සියයක් තිස්සේ මෙම ස්ථානය ජන ශූන්‍යව පැවතුණේ යැයි එයින් අදහස් නොවේ.

කාශ්‍යප රාජ යුගයේ දී සීගිරි කැටපත් පවුරේ ගී ලිවීමට තබා එහි සිටි දෙරටු පාල ආරක්ෂකයින්ට අල්ලසක්වත් දී මෙම සීගිරි සංකීර්ණයට යෑමට ඉඩ නොවන්නට ඇත. එසේ නම් මේ සීගිරි ගී ලියන ලද්දේ ක්‍රි. ව. 8 වැනි සිය වසේ සිට නම් ඒ ගී ලියන ලද්දේ කවුරුන් විසින්දැයි විමසා බලමු.

මෙසේ හුදී ජනයා දිවයිනේ දුර බැහැර ගම් නියම්ගම් පසු කොට සීගිරියට පැමිණ එහි කටු පඳුරු මත පිය නගා සැඩ සුළඟ නොබලා ගිරි මුදුනට පිවිසියේ සිය රජු වෙනුවෙන් රණ බිමට යන්නට නොව, ඔහුගේ අබිමන් පුරය රකින්නට නොව, වෙනත් අයුරකින් හෝ රජුට මෙහෙ කරන්නට ද නොව, රජු හැරපියා ගිය සීගිරියෙහි තවමත් රැඳී පැවති සජීවී සුන්දරත්වයේ ආශිර්වාදය ලබන්නට යි. ගිරි මුදුනේ සිට පහතින් පිහිටි, ඈතට විහිදෙන තෝතැන්න නරඹන්නටයි ගිරි බෙයන්ද්හි සිත්තම් කළ සිත්කළු ලළනාවන් දැක බලා ගන්නටයි. පෙර පැමිණි තම මුතුන්මිත්තන් කුරුටු ගෑ ගී වල රස විඳිමින් කැටපත් පවුර දිගේ හෙමින් සීරුවේ ඉදිරියට ඇදී යන්නටයි. ඒ සියල්ලටමත් වඩා පෙර සිරිතට අනුව තමා දුටු දෙයින් ජනිත වූ පහන් සංවේගය හිටිවන ගීයට නගා නික්ම යන්නට පෙර කැටපත් පවුරෙහි කුරුටු ගා තබන්නටයි. මෙකී යුගවල ජනී ජනයා හමුවෙහි එහි නිර්මාපකයා සිහිනෙනුදු නොසිතූ මෙහෙයක් සීගිරියෙන් ඉටුවෙමින් පවතී. සීගිරි කසුබ් කළ පෙනෙන තෙක් මානයට පිවිසිය නුහුණු හුදී ජනයා හෙතෙම හැර පියා ගිය තැන එහි පැමිණ සිත් සේ සැරිසරා වරෙක සිය රජු නතිවම භුක්ති විඳි ආස්වාදය රිසි සේ බෙදා ගනු දක්නට ලැබිණි. සීගිරිය ඓතිහාසික ලේඛන වලින් ගිලිහී ගිය ද පොදු ජන සිත් සතන්හි සියවස් ගණනාවක් යන තුරුම රැඳී තිබිණි.

(මහාචාර්ය අමරදාස ලියනගම මහතා)

(එදිරිවීර සරච්චන්ද්‍ර විමංසා උපහාර අංකයට ලියූ සීගිරිය බලකොටුවක් ද සුබ නිකේතනයක් ද ඓතිහාසික විමර්ශනයකි.

ලිපිය : පිටු 448 - 449 - (1987)

එනම් සීගිරි කුරුටු ගී පළමුව සොයා ගත්තේ කවුරුන්දැයි ඔහු මෙසේ පවසයි.


කැටපත්පවුරේ ඇති මේ පුරාණ ලිපි අපි කුරුටු ගී ලිපි යනුවෙන් හඳුන්වමු. පළමුව මේවා දක්නා ලද්දේ බෙල් විසිනි. දිවයිනේ අනේකවිධ පුරාණ ස්මාරක ගවේෂණය කිරීමේ කැණීමේද සංරක්ෂණය කිරීමේද නිති නිරතව සිටිය දී පවා ඔහු මේ කුරුටු ලිපි අධ්‍යයනය කිරීම සඳහා කාලය වැය කළේය.

සිංහල ශබ්ද විද්‍යාව හා පුරාක්ෂර විද්‍යාව හදරන්නන්ට මේ කුරුටු ලිපිවල ඇති මහත් වැදගත්කම වටහා ගැනීමේ ගෞරවය බෙල්ට අයත් වෙයි. ඔහු මෙසේ කියයි. කෙටි වුවද ගැඹුරු අරුත් රහිත වුවද මේ පුරාක්ෂර විද්‍යාත්මක හා වාග් විද්‍යාත්මක හේතු මත සැලකිල්ලෙන් අධ්‍යයනය කළ යුතු වේ. පෞරාණික හා යල්පැන ගිය අක්ෂරවලින් ද පද රූප වලින් ද සිංහල අක්ෂර මාලාව හා භාෂාව අනුක්‍රමයෙන් විකරණය හා වර්ධනය වූ අයුරු ගවේෂණය කිරීම සඳහා මේවා අගනා ක්ෂේත්‍රයක් වන්නේය.

(සීගිරි කුරුටු ගී I පි. 10)

පරණවිතාන මහතා ඉන් පසුව බෙල් මහතාගේ සහායක ජෝන් ස්ටිල්ගේ ද බෙල්ට පසු පුරාවිද්‍යා කොමසාරිස් වරයා වූ අයර්ටන් මහතාගෙන් මේ සඳහා වූ දයකත්වය මෙසේ සටහන් කරයි.

"ටිකකලකට බෙල්ගේ සහායකයා වූ ජෝන් ස්ටිල් හා බෙල්ගේ අනුප්‍රාප්තිකයා වූ අයර්ටන් මේ කුරුටු ලිපි කෙරෙහි උනන්දුවක් දැක්වූ බව පෙනේ. ස්ටිල් විසින් සකසන ලද මේ ඇතැම් කුරුටු ලිපිවල නෙත් පිටපත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්තා අතර තිබී හමු වුණි. එහෙත් මේ පුරාවිද්‍යාඥයන් දෙදෙනාගෙන් එක් අයෙකුවත් කුරුටු ලිපි කියැවීමෙහි හෝ ව්‍යාඛ්‍යානයෙහි ලා කිසිම ප්‍රගතියක් ලද බවත් කිව නොහැකිය.



සීගිරි කුරුටු ගී ලියා ඇති අයුරු

මහාචාර්ය සෙනරත් පරණවිතාන පඬිවරයා විසින් සිදු කරන ලද මේ ශාස්ත්‍රීය මෙහෙවර පිළිබඳ කතාබහ කර ඇත්තේ ඉතාමත් ස්වල්ප වශයෙනි. එම නිසා සීගිරි කුරුටු ගී ගැන විමසන මේ අවස්ථාවේ දී ඒ පිළිබඳව විමසා බලමු. පරණවිතාන මහතා මෙසේ සඳහන් කරයි.

"මා පළමු වරට මේ ලිපි පරීක්ෂා කළේ 1928 දී ය. කැටපත්පවුර අබියස දී තුන් දිනක් (එවිට ඔහු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට බැඳී වසර පහකි) කුරුටු ලිපි අධ්‍යයනය කිරීමෙන් පසුව අට වන සියවසේ සිට දහවන සියවස තෙක් කැටපත් පවුරේ කුරුටු ගා තිබෙන බොහෝ සියගණන් ලිපි සිංහල භාෂාවේ ඓතිහාසික විකාසනය හැදෑරීමෙහිලා බෙල් සිතුවාටත් වඩා ප්‍රයෝජනවත් බව මට ඒත්තු ගියේ ය.

මේ කාලවලට අයත් අකුරුවලින් ලියා තිබෙන කුරුටු ලිපි බහුතරය පද්‍ය බවත් ඒවායින් බොහෝ පද්‍ය උසස් සාහිත්‍යමය අගයකින් යුතු රචනා බවත් ඒවා අතර ඇතැම් රචනා ස්වභාවය සිංහල සාහිත්‍යයේ හොඳම නිර්මාණවලට සමාන වන බවත් වටහා ගැනීමට මම සමත් උනෙමි.

පැරණි ලේඛන හඳුන්වනු ලබන්නේ අභිලේඛන (Epigraphy) එපිග්‍රැෆි යන නාමයෙනි. මේ ශිලාලේඛන ඇතුළු අනෙකුත් සියළුම පැරණි ලේඛන මීට අයත් වේ. උදහරණ ලෙසින් ගලේ කෙටූ අකුරු ද තල්පත්වල ලියූ ගඩොල්, මැටි, රන්පත්, රිදී පත්, තඹපත් ආදී සියළුම පැරණි අකුරු සහිත ලේඛන වලට ඉහත සඳහන් නාමය යෙදේ. ශිලාලේඛන මෙයින් එක් වර්ගයක් පමණි. ශිලාලේඛන සඳහා ඉන්ස්ක්‍රිප්ෂන්ස් (Inscriptions) යන නාමය යෙදේ. ශිලාලේඛන එක් එක් සියවස්වලදී ක්‍රමික විකාශනයක් පෙන්නුම් කරයි. එපමණක් ද නොව ශිලාලේඛන ඒ පිළිබඳ පළපුරුදු ගල්වඩුවන් විසින් ලෙන් ටැම් පුවරු හෝ පර්වතවල ලියා තිබෙනු දක්නට ලැබේ.

එමෙන්ම ශිලා ලේඛනයක් බොහෝ විට එකම ගල්වඩුවෙකු විසින් ගලේ කොටන ලද නිසා එම අක්ෂරවල සමරූපීතාවයක් දක්නට ලැබේ.

එහෙත් සීගිරි කුරුටු ගී වල මේ ලක්ෂණය දක්නට නැත. ක්‍රි. ව. 8 වැනි සියවසේ සිට සීගිරිය නැරඹීමට පැමිණි ජනතාව විසින් සීගිරි කැටපත් පවුරේ ලියන ලද මෙම සීගිරි ගී වල ඇති අකුරුවල සමරූපතාවයක් දක්නට නැත. මේ පිළිබඳව ද මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා මෙසේ සඳහන් කරයි.

**"සෑම විටම ශිලාලිපි කොටා තිබෙන්නේ සැලකිල්ලෙනි. අකුරුවල ආකාරය නොවෙනස් වන ලෙස කෙටීමට අවශ්‍ය අවධානය යොද ඇත. එනමුත් මේ කුරුටු ලිපි ලියා තිබෙන්නේ විවිධ පුද්ගලයින් වන හෙයින් ඒවායේ අක්ෂර සමරූපතාවක් අපේක්ෂා කළ නොහැකිය. ඇතැම් කුරුටු ලිපි ඉතා මහත්සියෙන් ලියා තිබෙන බවත් ඒවායේ අකුරු ඉතා සුන්දර බවත් පිළිගත යුතුය.**

එහෙත් අතික් කුරුටු ගී ලියා තිබෙන්තේ අපිරිසිදු ලෙස ය ඒවායේ නනි අකුරු බොහෝවිට විරූප වී ඇත. නවද බදමෙ ලිවීම බොහෝ දෙනෙ ලෙහෙසි කටයුත්තක් වී නැත.

## සීගිරි ගී කැටපත් පවුරේ ගී රචනා හා සැසඳීම

සීගිරි ගී පිළිබඳව විවිධ විද්වත්හු අර්ථකථන දෙති. මහාචාර්ය සෙනරත් පරණවිතාන පඬිවරයා විසින් පිටපත් කරන ලද එම සීගිරි ගී ඕනෑම කෙනෙකුට කැටපත් පවුරේ ඇති එම සීගිරි ගී පෙළ සමග සසඳ බැලීම පිණිස පහසුවන ආකාරයට මෙම සීගිරි ගී පිටපත් කර තිබීම සැබැවින්ම පරණවිතාන පඬිවරයාගේ අධ්‍යයන ශික්ෂණය කෙතරම් පරිපාකයට පත්වී ඇත්ද යන්නට කදිම නිදසුනකි. ඔහු මෙසේ සඳහන් කරයි.

**"මේ කෘතියේ අන්තර්ගත වන ඕනෑම කුරුටු ලිපියක් කියවා තිබෙන ආකාරය සරිදැයි බලා ගැනීමට රිසිවන විද්‍යාර්ථියාට ඒ සඳහා අවශ්‍ය වන සෑම උපකාරයක් ම සලසා ඇත. සෑම කුරුටු ලිපියක් ම පාඨකයා වෙත ඉදිරිපත් කොට ඇත්තේ කැටපත් පවුරු බිත්තියෙහි පිහිටීම, එනම් කැටපත් පවුර වෙත පිවිසෙන විට හමුවන පළමු පියගැට පෙළෙහි උඩම පියගැටයේ සිට දුර ප්‍රමාණය හා බිම් මට්ටමේ සිට උස ප්‍රමාණය දැක්වීමෙනි. කැටපත් පවුරේ පාදම ඍජු රේඛාවක පිහිටා නැති හෙයින් එකම තැන දෙවරක් මැනීමේ දී සුළු වෙනස්කම් දිස්විය හැකිය. සෑම කුරුටු ලිපියකට ගැබ් වන පේළිවල සංඛ්‍යාව හා දිග ද අකුරුවල ප්‍රමාණය ද ආරක්ෂා වී තිබෙන සැටිය ද දක්වා ඇත. ඒවා එම කුරුටු ලිපි හඳුනා ගැනීම සඳහා අමතරව උපකාරී වනු ඇත.**

**සීගිරි කුරුටු ගී 1 කොටස මහාචාර්ය සෙනරත් පරණවිතාන පිටු V පරිවර්තනය මහාචාර්ය සුචරිත ගම්ලත් ප්‍රකාශනය පරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2000.**